15

# උදය

## සිරි ගුනසිංහ (1925)

නිසඳැස් කාව්‍ය සම්ප්‍රදාය ප්‍රචලිත කරමින් නූතන සිංහල පද්‍යයේ ගමන් මගෙහි විප්ලවීය වෙනසක් ඇති කළ සිරි ගුනසිංහ මහතා **මස් ලේ නැති ඇට**, **අබිනික්මන**, **රතු කැකුල** හා **ආලකමන්දාව** යනුවෙන් කාව්‍ය සංග්‍රහ හතරක් රචනා කළේ ය. කොළඹ යුගයේ මුල් පරපුරේ කවීන් හා ඔවුන්ගේ නිර්මාණ මොහු ඉතා ඍජු ලෙස විවේචනය කරයි. වෙනස් වන ලෝකය තුළ මානව හා සමාජ තත්ත්ව නිරූපණය උදෙසා නව්‍ය කාව්‍ය ආකෘතියක, භාෂාවක, අලංකාර භාවිතයක හා පුළුල් වස්තු විෂයයක අවශ්‍යතාව දිගින් දිගට ම ගෙනහැර දක්වයි. බටහිර කවියේ ආභාසය ලබමින් මානව ජීවිතයේ නිස්සාරත්වය කෙරෙහි අවධානය දක්වමින් කවිය විප්ලවීය වෙනසකට ලක් කළේ ය. කවියෙහි අර්ථ රසය වඩා උසස් ගණයෙහි ලා සැලකූ හෙතෙම, භාවමය සංකීර්ණතා කවියට ආදේශ කර ගනිමින් මානව ජීවිතයේ හා සමාජ දේහයේ එතෙක් කවීන්ට ඇස නොගැසුණු තේමාවන් නව මානයකින් කවියට නැගීමට පෙළඹුණේ ය. ජීවිතයේ සෞන්දර්යාත්මක පක්ෂය පමණක් වර්ණනයෙහි ලා යෙදුණු පූර්ව යුගයේ කවීන් නිර්දය විවේචනයට ලක් කළ



මොහු කවිය වනාහි මානව හා සමාජ ජීවිතවල ගැඹුරු ප්‍රකාශනයක් බවට පත් කරමින් එය නූතනය දක්වා ප්‍රවේශ කරවීමේ පුරෝගාමී චරිතයක් බවට පත් විය.

කවියකු පමණක් නොව,නවකතාකරුවකු, චිත්‍රකලා විචාරකයකු, චිත්‍රපට අධ්‍යක්ෂවරයකු ද වූ ගුනසිංහ නූතන සිංහල කාව්‍ය සම්ප්‍රදායේ විප්ලවීය චරිතයක් ලෙස පිළිගැනේ.

පෙරදිග ගොරහැඬි රකුසෝ,
මගේ ධ්‍යානය ඇයි කඩන්නේ
නිදා ගන්න පොරෙවාගත්ත
කලු රෙදි පොට
මොකටද මේ
තීරුවලට ඉරා දමන්නෙ.

කුරුල්ලන්ට ගල් ගහලා
උන් හොඳටම බිය කරලා
මල් පොහොට්ටු තිගැස්සිලා
කඳුලු හෙලනවා.

ඇස් දෙක මම අරින්නෙ නෑ
තුරුලු කරන් භාවනාව
නැවතත් යන්නට යනවා
මම
මගේ දූහැන ලෝකයටම

## ලිඛිත අභ්‍යාස

1. 'උදය' පද්‍ය පන්තියෙන් ඉදිරිපත් කෙරෙන අදහස විචාරාත්මකව විමසන්න.
2. ප්‍රතිභාව නිර්මාණ සඳහා කවියා උපයෝගී කර ගෙන ඇති කාව්‍යෝක්ති පිළිබඳ ඇගයීමක් කරන්න.
3. අපූර්වත්වය නිර්මාණාත්මක සාහිත්‍ය කෘතියක සාර්ථකත්වයට ඉවහල් වන ආකාරය 'උදය' කවිපෙළ ඇසුරෙන් විමසන්න.